# ප්‍රසම්පාදන දැන්වීම

## ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

# නිල්වැල්ල, කුඩාවැල්ල, සුදුවැල්ල සහ දොඩන්දූව ධීවර වරායන්හි දියකඩන ප්‍රතිසංස්කරණය කිරීම.

# (Breakwater rehabiliation work at Nilwella, Kudawella, Suduwella and Dodanduwa Fishery Harbours)

## *(CFHC/PD/BW/NIL-KUD-SUD-DOD/2026-30)*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙනුවෙන් සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් **නිල්වැල්ල, කුඩාවැල්ල, සුදුවැල්ල සහ දොඩන්දූව ධීවර වරායන් හි දියකඩන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා** යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. විස්තර පහත දක්වා ඇත.

| අනු අංකය | විස්තරය සහ ප්‍රසම්පාදන අංකය | ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම සහ කොන්ත්‍රාත් කාලය | යෝග්‍යතා අවශ්‍යතා | ලංසු බැඳුම්කර මුදල | ලංසු වලංගු කාලය | ආපසු නොගෙවනු ලබන තැන්පතු මුදල |
|---|---|---|---|---|---|---|
| 01 | නිල්වැල්ල, කුඩාවැල්ල, සුදුවැල්ල සහ දොඩන්දූව ධීවර වරායන් හි දියකඩන ප්‍රතිසංස්කරණය.<br><br>**(CFHC/PD/BW/NIL-KUD-SUD-DOD/2026-30)** | **රුපියල් මිලියන 49,000,000.00** (වැට් බදු සහ අනපේක්ෂිත වියදම් රහිතව)<br><br>කොන්ත්‍රාත් කාලය - **කැලැන්ඩර් දින 180 කි.** | 01) CIDA Grade – C5 හෝ ඉහළ - සමුද්‍රීය ඉදිකිරීම් සඳහා (Maritime Construction) | වටිනාකම **රු. 613,000.00** දී ඇති ආකෘතියට අනුව ලංසු වලංගු කාලය **2026.07.22** දක්වා වලංගු විය යුතුය. (මුදල් තැන්පතු භාර ගනු ලැබේ). | ලංසු භාර ගන්නා අවසාන දින සිට **2026.06.24** දින දක්වා වලංගු විය යුතුය. | **රු. 12,500.00** |

මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ සුදුසුකම් ලත් සැපයුම්කරුවන් හෝ නම් කළ නියෝජිතයින් සඳහා **2026.03.05 දින සිට 2026.03.25 දින දක්වා** රාජකාරි දිනයන් හි **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** ප්‍රධාන කාර්යාලයෙන් හෝ වරාය කළමනාකාර **(නිල්වැල්ල, කුඩාවැල්ල, සුදුවැල්ල සහ දොඩන්දූව)** වෙත ලිඛිත ඉල්ලීමක් කිරීමෙන් හා ආපසු නොගෙවනු ලබන **රු. 12,500.00 ක** ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ලංසු ප්‍රසම්පාදන ලේඛන ලබා ගත හැකිය.

ප්‍රධාන කාර්යාලය, නිල්වැල්ල, කුඩාවැල්ල, සුදුවැල්ල සහ දොඩන්දූව ධීවර වරායන් යන ස්ථානවල දී අදාළ ප්‍රසම්පාදන ලේඛනය නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 08 වන වගන්තියට අනුව පොදු කොන්ත්‍රාත් ලේඛනය මගින් නිකුත් කරන සහතිකය (ලංසු වටිනාකම රුපියල් මිලියන 05 ට වැඩි වන අවස්ථාවල දී) ලබා දිය යුතුය. ලංසු ඇපකරය ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් කරනු ලබන ප්‍රථම ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් බවට පත් කළ හැකි ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් ලබා ගත යුතු අතර **සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක:15, රොක්හවුස් පටුමග, කොළඹ 15** නමට නිකුත් කළ යුතුය. ලංසු ඇපකරය, මුදල් තැන්පතුවක් (ශ්‍රී ලංකා රුපියල්) ලෙස ද ගෙවීම් කළ හැකිය.

ප්‍රසම්පාදන ලේඛන පිටපත් දෙකකින් මුල් පිටපත සහ අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර තනි කවරයකට බහා ඉදිරිපත් කළ යුතුය.

නියමිත පරිදි අත්සන් කොට නිල රබර් මුද්‍රාව යොදා ප්‍රසම්පාදන ලේඛන ලිපි කවරයක ඇතුළත් කොට එහි වම් කෙළවරේ අදාළ කොන්ත්‍රාත්තුවේ නම සහ දිනය සඳහන් කර **2026.03.26 දින පෙ.ව. 11.00 ට** හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථා ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ හැකිය.

විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ලේඛන **2026.03.26 දින පෙ.ව. 11.00 ට** පසු වූ වහාම ප්‍රසම්පාදන අංශයේ දී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ප්‍රසම්පාදන ලේඛන ප්‍රතික්ෂේප කරන අතර විවෘත කිරීමකින් තොරව ආපසු භාර දෙනු ලැබේ.

අදාළ ප්‍රසම්පාදන ලේඛන පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් වශයෙන් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

මේ සම්බන්ධයෙන් පූර්ව ලංසු රැස්වීම **2026.03.16 දින පෙ.ව. 11.30 ට** ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු **0112-529391 (කළමනාකාර සිවිල් ඉංජිනේරු)** හෝ **0112-525063 (වැ.බ.කළමනාකාර ප්‍රසම්පාදන)** වෙතින් ලබා ගත හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව
අංක:15, රොක්හවුස් පටුමග, කොළඹ 15

SELACINE